රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 12/2001 2001.05.30 දින

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු හා සංස්ථා ප්‍රධානීන්.

## ජන හා නිවාස සංගණනය 2001

වසර 2001 දී ජන හා නිවාස සංගණනයක් පැවැත්වීමට රජය තීරණය කර ඇත. මෙම සංගණනයේදී එකතු කරගන්නා දත්ත අදළ ප්‍රදේශයන්හි සංවර්ධන වැඩකටයුතු කැලසුම් කිරීම සඳහා රජයේ සියළු ආයතන විසින් උපයෝගී කරගනු ලැබේ. වසර 2001 මැයි,ජුනි,ජූලි මාස වලදී පහත සඳහන් කටයුතු සිදුකිරීමට නියමිතව ඇත.

i. ගණන් ගන්නා නිලධාරීන් පුහුණු කිරීම - 2001 මැයි 20 සිට ජුනි 20 දක්වා

ii. මූලික සංගණනය - 2001 ජුනි 25 සිට ජූලි 05 දක්වා

iii. අවසාන සංගණනය - 2001 ජූලි 17 ප.ව. 6.00 සිට මධ්‍යම රාත්‍රී 12.00 දක්වා

02. මෙම සංගණනය සිදු කරනු ලබන්නේ සංගණන ආඥා පනතට අනුව වන අතර, ඒ යටතේ අදළ ප්‍රදේශයන් හි සංගණනය පැවැත්වීම සඳහා දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශීය ලේකම්වරු සංගණන කොමසාරිස්වරු හා නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරු වශයෙන් පත්කරනු ලැබ ඇත. දිවයින පුරා ඇති පළාත් සභා, සංස්ථා, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් හා ප්‍රාදේශීය කාර්යාලයන්හි නිලධාරීන් ද ඇතුළුව 1,20,000 ක් පමණ මෙම සංගණනයේදි රාජකාරි සඳහා යොදවන හෙයින් මෙහි මෙහෙයුම් පාර්ශවය ඉතා සංකීර්න හා විශාල එකක් වනු ඇත. නිලධාරීන් හා ලිපි ලේඛන (සංගණන උපලේඛන, උපදෙස් පොත්, වෙනත් අදල ලේඛන) ප්‍රවාහනය සඳහා විශාල වාහන සංඛ්‍යාවක් ද යෙදවීමටද සිදුවන වා ඇත.

03. පළමු ජේදයේ සඳහන් කටයුතු ඉටුකිරීම සඳහා මධ්‍යම රජයේ හා පළාත් රාජ්‍ය සේවයන් හි නිලධාරීන් දහස් ගනනක් අධීක්ෂණ නිලධාරීන්, පුහුණු කිරීමේ නිලධාරීන් හා ගණන් ගන්නා නිලධාරීන් වශයෙන් සේවයේ යොදවා ඇත. මීට අදළ සමහර කටයුතු කාර්යාල වේලාවන්ගෙන් බැහැර වේලාවන් හි සිදුකිරීම අපහසු නිසා මෙම කටයුතු වල නිරතවන නිලධාරීන් කාර්යාල වේලාවන් හිදී සාමාන්‍ය රාජකාරි වලින් මුදා හැරීමට සිදුවනවා ඇත.

04. දිස්ත්‍රික් ලේකම්වරුන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් හට ඉහත 01 ජේදයෙහි i,ii,iii හි සඳහන් කටයුතු, අදළ කාලයන් තුළදී හා 2001 ජූලි මාසයේ 16 වන සිට 19 දින දක්වා ඉටුකිරීම සඳහා සැහෙන වාහන සංඛ්‍යාවක් අවශ්‍ය වනවා ඇත.

05. i. සංගණන කටයුතු ඉටුකරන නිලධාරින් හට අවශ්‍ය වූ විටදී රාජකාරි නිවාඩු ලබාදෙන ලෙස මේත් ඉල්ලන අතර රාජකාරි නිවාඩු සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළයුත්තේ සංගණන කොමසාරිස්වරු හා නියෝජ්‍ය සංගණන කොමසාරිස්වරුන් විසිනි.

ii. ඉහත පලමු ජේදයේ i,ii,iii. හි සඳහන් කරන ලද ජාතික සංගණන කටයුතු සඳහා ඔබ සංචිතයේ ඇති වාහන 2 ක් හෝ 3 ක් ( වෙනත් රාජකාරි සඳහා වෙන්කර ඇති ඒවා හැර) නිදහස් කරන ලෙස ඉල්ලමි. මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම්වරු හා ප්‍රාදේශිය ලේකම්වරු ඔබ සමඟ අදහස් හුවමාරු කරගන්නවා ඇත. ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් දිස්ත්‍රික් ලේකම්වරුන්ට හා ප්‍රාදේශිය ලේකම්වරුන්ට වෙන්කර දෙනු ලබන ප්‍රතිපාදන වලින් රියදුරු අතිකාල, බටා හා ඉන්ධන වියදම් ආවරණය කරගත හැක.

06. 2001 ජන හා නිවාස සංගණනය සාර්ථකව ඉටුකරගැනීමට ඔබ ලබාදෙන සහයෝගය අගය කරමි.

07. මහා භාණ්ඩාගාරයේ එකගතාවය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

එම්.එන්. ජුනයිඩ්
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු හා
පරිපාලන ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය